රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: **36/92**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

**1992** දෙසැම්බර් මස **18** වෙනි දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
ප්‍රධාන ලේකම්වරුන්,
දිසාපතිවරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානින්,
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්,
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල හා
රජයට අයත් සමාගම්වල සභාපතිවරුන් / නිසිබලධාරීන් වෙත.

**<u>රාජ්‍ය භාෂා නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා</u>**
**<u>කාර්යාල අවශ්‍යතා සපුරා ගැනීම.</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV පරිච්ඡේදයෙහි දක්වා සිටිනු ලබන භාෂා නීතිය දිවයින පුරා අර්ථවත් ලෙස ක්‍රියාත්මක කිරීමෙන් ජනතාව සතු භාෂා නිදහස ඵල ගැන්වීම රජයේ අරමුණයි. එසේ හෙයින් භාෂා නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගතයුතු පියවර සම්බන්ධයෙන් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ විශේෂ අවධානය යොමු කිරීම අවශ්‍යව තිබේ.

**02.** නව භාෂා නීතිය යටතේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන කවර භාෂාවකින් වුව ද, රජයේ කාර්‍යාලයකින් සිය කටයුතු ඉටුකරවා ගැනීමේ අයිතිය පුරවැසියා සතු වන හෙයින්, පුරවැසියාගේ එකී අපේක්ෂාවෙන් නොපිරිහෙලා ඉටුකිරීමේ කටයුත්තෙහි සියළු රජයේ ආයතන සමත් විය යුතුය.

**03.** මේ සම්බන්ධයෙන් දක්නා ලද ප්‍රධාන දුර්වලතාව නම් පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ රජයේ ආයතන වෙත ඒ ඒ භාෂාවලින් කටයුතු කිරීමේ හැකියාව සහිත නිලධාරීන්ගේ විරලතාවය එම හේතුවෙන් එක් භාෂාවක් පමණක් දන්නා වූ ජනයා තුළ රජයේ කාර්‍යාල කෙරෙහි ඇති විශ්වාසය බිඳ වැටේ.

**04.** රජයේ නිලධාරීන්ට අදාල භාෂාවන් උගැන්වීමේ කටයුතු දැනට සිදුවෙමින් පවතින නමුත් භාෂා නීතිය ක්‍රියාත්මක කිරීම එම කටයුත්ත නිමවන තෙක් පමා නොවිය යුතු හෙයින්, සෑම රජයේ ආයතනයකම පළාතේ සුළු ජන කොටස් භාවිතා කරනු ලබන භාෂාවෙහි හුරුපුරුදු එක් නිලධාරියෙකු හෝ සේවයේ යොදවා ගැනීමට පපියවර ගන්නා ලෙස සියළු ප්‍රධානීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

**05.** තමාගේ ආයතනයට අවශ්‍ය යතුරුලියන වැනි උපකරණ මිළදී ගැනීමට ද අප්‍රමාදව ක්‍රියා කළයුතු අතර, යතුරු ලේඛක ආදී තනතුරු ඇති කිරීමේ හා ඒ සඳහා නිලධාරීන් ලබා ගැනීමේ අවශ්‍යතාවය කෙරෙහි ද ආයතන ප්‍රධානීන්ගේ අවධානය යොමු කරනු ලැබේ. බොහෝ විට අනෙක් භාෂාවකින් කටයුතු කළහැකි ලිපිකරු නිලධාරියකු ඇති අවස්ථාවක යතුරු ලේඛකයකු ඉල්ලා සිටීම වෙනුවට එම භාෂාවෙන් යතුරු ලියනය කිරීමේ පුහුණුවක් එම නිලධාරියාට ලබා දී අමතර දීමනාවක් මත යතුරු ලේඛක කටයුතු ගැනීම වඩාත් බුද්ධිගෝචර වනු ඇත.

**06.** තමා යටතට ගැනෙන්නා වූ දෙපාර්තමේන්තු හා ආයතන තුළ භාෂා නීතිය ක්‍රියාත්මක කිරීමේ අඩු ලුහුඬුකම් සම්බන්ධයෙන් සොයාබලා නිසි පියවර ගන්නා ලෙස ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

**07.** භාෂා ප්‍රවීණත්වය හා උපකරණ හිඟය රාජ්‍ය භාෂා නීතිය ක්‍රියාත්මක කිරීම පමා කිරීමේ හේතුන් ලෙස තවදුරටත් දක්වනු ලැබීම රජය විසින් අනුමත නොකරනු ලැබේ.

අ.කලේ/ (එම්.එන්.ජුනයිඩ්)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.